# ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති සන්ධානය
## கிராம உத்தியோகத்தர்கள் தொழிற் சங்கக் கூட்டணி
## Grama Niladhari Trade Union Alliance

**45/ 94,** නාවල පාර, නාරාහේන්පිට, කොළඹ **05.**
45/94, நாவல வீதி, நாரஹென்பிட, கொழும்பு 05.
**45/94, Nawala Road, Narahenpita . Colombo 05.**


| | | |
|---|---|---|
| මගේ අංකය: **GNTUA/MIN/2026/08**<br>எனது இல: | ඔබේ අංකය:<br>உமது இல: | දිනය: **2026/06/24**<br>திகதி: |

ලේකම් තුමා,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**<u>ග්‍රාම නිලධාරීන් සඳහා අනුමත කර ඇති ඉන්ධන දීමනාව ලබා නොදීමට එරෙහිව ක්ෂේත්‍ර රාජකාරි සීමා කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය පිළිබඳ ව දැනුම් දීම.</u>**

2024.03.11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමත කරන ලද අමප 24/0240/605/008-1 දරන කැබිනට් පත්‍රිකාවට අනුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය විසින් 2025.01.15 දින නිකුත් කරන ලද අංක HA/3/11-5 දරන ලිපිය මඟින් ග්‍රාම නිලධාරීන්ගේ නිල ඇඳුම් දීමනාව සංශෝධනය කර ඇති අතර, එම ලිපියේ ම සඳහන් පරිදි මාසිකව සන්නිවේදන දීමනාව රු. 1500/= ක්ද ක්ෂේත්‍ර රාජකාරි සඳහා ගමන් වියදම් දීමනාව ඉන්ධන ලීටර් 20කට සමාන දීමනාවක් ද ලෙස ලබා දීමට ද අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, එම සන්නිවේදන දීමනාව හා ඉන්ධන දීමනාව ලබා දීම මේ දක්වා ක්‍රියාත්මක නොකිරීමෙන් එය හිතාමතා ප්‍රමාද කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

02. මෙම ගැටලුව සම්බන්ධයෙන් සියලු ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති තනි තනිව මෙන් ම ඒකාබද්ධ ව ද, වසර එකහමාරකට ආසන්න කාලයක් තිස්සේ අදාළ දීමනා ලබා දෙන ලෙස අඛණ්ඩව ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී 2025 අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබූ මෙම දීමනාව අත්තනෝමතික ලෙස අත්හිටුවා, එය ඉදිරි වැටුප් කොමිෂන් සභාව වෙත යොමු කළ බව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2026.05.14 දිනැති BD/GN/130/53/2023 දරන ලිපිය මඟින් දැනුම් දී ඇත. අපගේ නිරීක්ෂණය අනුව, මෙය ග්‍රාම නිලධාරීන්ට හිමි දීමනා ලබා නොදී තවදුරටත් බලධාරීන්ට කල් ගැනීමට සිදු කල නොමග යැවීමක් බව පෙනී යයි. රාජ්‍ය සේවයේ පරිපාලන බලධාරීන් ඇතුළු අනෙකුත් සේවාවන් ගේ ගමන් වියදම් දීමනා ඇතුළු අනෙකුත් දීමනා වැඩි කර ලබා දෙනු ලබන්නේ කවර වැටුප් කොමිසමක නිර්දේශ මත දැයි අප විමසා සිටිමු. පසුගිය වසර දහයක් තුල පිහිට වූ රනුග්ගේ වැටුප් කොමිසමේ සිට උදය ආර්. සෙනෙවිරත්න දක්වා වැටුප් කොමිෂන් මගින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක වී නැති බව ද සිහිපත් කරවමු. ඉහල පරිපාලන බලධාරීන්ට අවශ්‍ය සේවාවන් ගේ දීමනා අසීමාන්තික ව පසුගිය වසර දහයක කාලය තුල වැඩි කර ඇති නමුත්, ග්‍රාම නිලධාරීන්ට හිමි විය යුතු දීමනා වැඩි කර නැති බව පෙන්වා දෙමු. මෙය අසමාන ලෙස සැලකීමක් වන අතර සමස්ත ග්‍රාම නිලධාරීන්ගේ හා පවුල්වල සාමාජිකයන්ගේ ජීවත් වීමේ අයිතියට අභියෝග කරන, මානව හිමිකම් ද ඇතුළු මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ද වේ. අනුමත කර ඇති දීමනාවක් ක්‍රියාත්මක නොකිරීම බරපතළ පරිපාලනමය පැහැර හැරීමක් බව අවධාරණය කරමු. කාර්යාල දීමනා හා ලිපි ද්‍රව්‍ය දීමනා කිසිවක් ග්‍රාම නිලධාරීන්ට පෞද්ගලිකව හිමි දීමනා නොවන අතර ඒවා පරිපාලන වියදම් බව පෙන්වා දෙමු.

03. වර්තමානයේ පවතින ඉන්ධන මිල ඉහළ යාම සහ ජීවන වියදම් ඉහළ යාම හේතුවෙන් ඉහල යන උද්ධමනය හමුවේ ග්‍රාම නිලධාරීන්ට ලැබෙන අවම වැටුපෙන් රාජකාරි සඳහා ගමන් වියදම් දරා ගැනීම තවදුරටත් කළ නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. ග්‍රාම නිලධාරීන්ට වැටුප් ගෙවන්නේ රාජකාරි අවශ්‍යතා සඳහා වියදම් කිරීමට ද නැතහොත් ජීවත් වීමට දැයි අප සංගම් ඔබගෙන් විමසා සිටිමු. එබැවින්, අපගේ සාධාරණ ඉල්ලීම් කෙරෙහි නිසි අවධානයක් යොමු නොකළ හොත්, ඉදිරියේ දී අඛණ්ඩ වෘත්තීය ක්‍රියාමාර්ග වෙත යොමු වීමට සිදුවන බව කනගාටුවෙන් දැනුම් දෙන අතර, මූලික අදියරක් ලෙස ක්ෂේත්‍ර රාජකාරි සීමා කිරීමේ වෘත්තිය ක්‍රියාමාර්ගයකට එළඹීමට තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

එසේම, මෙම ගැටලුව සඳහා සාධාරණ විසඳුමක් ලබා දීමට බලධාරීන් අපොහොසත් වුවහොත්, දෙවනුව දැව, ඉඩම්, මරණ වාර්තා නිකුත් කිරීම්, වැනි අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල රාජකාරි වලින් ද ඉවත් වන බවත්, අවසානයේ දී සියලු රාජකාරිවලින් ඉවත් වීම දක්වා දැඩි වෘත්තීය ක්‍රියාමාර්ග වෙත යාමට සිදු වනු ඇති බව ද අවධාරණය කරමු.

04. ඒ අනුව, ග්‍රාම නිලධාරීන් සඳහා නිර්දේශ වී ඇති ඉන්ධන දීමනාව ලබා දෙන තුරු, 2026.06.24 දින සිට පහත සඳහන් වෘත්තීය ක්‍රියාමාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ග්‍රාම නිලධාරි වෘත්තිය සංගම් තීරණය කර ඇත.

i. සඳුදා දින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණීමෙන් වැළකීම.
ii. මාසික කොට්ඨාස දින රැස්වීම හැර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් කැඳවනු ලබන අනෙකුත් සියලු රැස්වීම් සහ විවිධ වැඩසටහන් කටයුතු සඳහා වන කැඳවීම් වර්ජනය කිරීම.
iii. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණීම ග්‍රාම නිලධාරි ට පහසු ලෙස මසකට දින දෙකකට සීමා කිරීම. එහි ප්‍රතිඵලයක් ලෙස, ග්‍රාම නිලධාරී කාර්යාල වෙත ලැබෙන මුදල් බැඳීම් සහ භාර දිය යුතු වාර්තා අවමය සති දෙකකට වරක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත භාර දීමට සිදු වනු ඇත.
iv. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නොවන අනෙකුත් සියලුම රැස්වීම්, ජංගම සේවා, උත්සව සහ විවිධාකාර වූ සියලුම කටයුතු සඳහා සහභාගී වීමෙන් වැළකී සිටීම.
v. රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් සියලු වැඩසටහන් සඳහා සහයෝගය ලබා නොදීම.
vi. 2026.06.30 වන දින ග්‍රාම නිලධාරී සංගම් සහ අනෙකුත් ආපදා සහන සේවා රාජකාරිවල නියුතු නිලධාරීන්ගේ සංගම් ඒකාබද්ධ ව සිදු කිරීමට නියමිත ආපදා රාජකාරි සම්බන්ධ පවතින ගැටලුවලට සාධාරණයක් ඉල්ලා කරන උද්ඝෝෂණයට සමගාමීව එදින සියළුම ග්‍රාම නිලධාරීන් ලෙඩ නිවාඩු වාර්තා කිරීම.

05. මෙම වෘත්තිය ක්‍රියාමාර්ගය හේතුවෙන් අධිකරණයට අදාළ රාජකාරි කටයුතු සීමා නොකරනු ඇත. ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමේ කාර්යාල දින රාජකාරි සාමාන්‍ය පරිදි සිදු කළ ද, ක්ෂේත්‍ර රාජකාරි සීමා සහිත ව පවත්වා ගෙන යන අතර ඉන්ධන වියදම් අවම වන ක්‍රමවේදයන් භාවිතා කිරීමට සිදුවීම හේතුවෙන් සේවා සැපයීමේ යම් ප්‍රමාදයන් ඇති විය හැකි බව ද කාරුණිකව දැනුම් දෙමු.

06. මෙම ගැටලුව සඳහා කඩිනම් හා සාධාරණ විසඳුමක් ලබා දීමට රජයේ බලධාරීන් අපොහොසත් වුවහොත්, සියලු රාජකාරිවලින් ඉවත් වීම දක්වා දැඩි වෘත්තීය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට සිදු වනු ඇති බව ද කාරුණිකව දන්වා සිටිමු.

ස්තූතියි,
මෙයට සංගම් නියමය පරිදි,
සම කැඳවුම්කරුවන්,


බී. ඩබ්. ඩී. අසංක කුලරත්න
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා එක්සත් ග්‍රාම නිලධාරී සංගමය
නාරාහේන්පිට.

එම්. කේ. පී. ජගත් චන්ද්‍රලාල්
ප්‍රධාන ලේකම්
සමස්ත ලංකා නිදහස් ග්‍රාම නිලධාරී සංගමය
අංක. A/10, නවගම්පුර දෙවන අදියර,
වැල්ලම්පිටිය. ලි.ප.අ.6245

ඒ. ඒ. හිරන්ත
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා ප්‍රගතිශීලී ග්‍රාම නිලධාරී සංගමය
නො:391/F, නුගගහවත්ත, කිරිබේරිය,
පානදුර.

ඒ.එච්.එම්. සුදක්ෂි තිලකරත්න
ප්‍රධාන ලේකම් (වැ.බ)
ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සංගමය
29/4/10, ඩී.එස්. සේනානායක වීදිය,
මහනුවර


පිටපත්:

| | | |
|---|---|---|
| 1. | අතිගරු ජනාධිපති තුමා, | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 2. | අමාත්‍ය තුමා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 3. | ජනාධිපති ලේකම් තුමා, | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 4. | අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු), | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 5. | සියළුම දිස්ත්‍රික් ලේකම් තුමන්ලා/ තුමියන්ලා, | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 6. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, (ග්‍රාම නිලධාරි පාලන), | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 7. | සියළුම ප්‍රාදේශීය ලේකම් තුමන්ලා/ තුමියන්ලා, | කා. දැ. ගැ. පි. හා අ. ක. ස. |
| 8. | සියළුම ග්‍රාම නිලධාරීන්, | ක්‍රියාමාර්ග අනුව කටයුතු කිරීමට |
| 9. | සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන ප්‍රවෘත්ති කතෘන්, | මාධ්‍ය අනුග්‍රහය ලබා දීම සඳහා. |